# ශ්‍රී මහා බෝධීන් වහන්සේ හා සම්බන්ධ බෝධාහර කුල පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

# [An investigative study of the Bodahara caste associated with the Great Bodhi]

**Ulpathagama Amitharathana**[1]
**Kirinde Ghanadarshana**[2]

**Abstract**

The arrival of Mahinda has made a significant contribution to the development of Sri Lankan culture. The cultural elements that emerged accordingly formed the basis for a new belief system and sociocultural background. The propagation of the Dharma in Sri Lanka and the planting of the Sri Maha Bodhi can be pointed out as the most important tasks among them. Not only the Bodhi, but also the Bodhisattva generation and various craft classes that came with it have also contributed to the caste differentiation of Sri Lankan society. Its value can be understood in the comparative analysis of the concept of Bodhi with Buddhist literary sources and other literary sources. Its historical value can be understood in the fact that information about the arrival of the Sri Maha Bodhi to Sri Lanka is mentioned in numerous literary sources. The social varieties of the Bodhisattva castes and caste classes associated with Bodhi are mentioned in various literary sources. There are also numerical discrepancies in the number of people who came. Among the duties assigned to this group, although many caste ranks known by different names were engaged in service in connection with the Maha Bodhi, at present all these tasks are performed by only one caste rank known as Villidura. That caste rank can be identified as a lineage that came from the Dunuwa caste rank among the chronicled caste ranks, and their physical features, their difference from the common human characteristics of Rajarata, and their inherent behavioral elements can be identified as the remnants of a foreign culture. They have also been given temple and village grants in return for the service duties they perform for the Sri Maha Bodhi, and the way in which those lands were leased is confirmed by the oldest existing genealogical records.

**Keywords**: Anthropology, Bodhahara clan, Craft series, Genetics, Orientation

1 Sub-Warden, Bhiksu University of Sri Lanka. E-mail: uamitharathana@gmail.com https://orcid.org/0009-0008-1796-4822

2 Independent Researcher, Bhiksu University of Sri Lanka, Anuradhapura.

### හැඳින්වීම

ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය සම්බන්ධයෙන් තොරතුරු අධ්‍යයනය කිරීමේ දී 'කුලය' යන්න දාර්ශනික අර්ථ නිරූපණ පළමුවෙන් කුලය පිළිබඳ ව කෙරෙන කුමන ආකාර ස්වරූපයක් ගනු ලබන්නේ ද යන කරුණ සම්බන්ධයෙන් සරල අදහසකින් මෙසේ නිර්වචනය කළ හැකි ය. 'කුලය' යන පදය සම්බන්ධයෙන් කරුණු සාකච්ඡා කිරීමේ දී කුලය යනු ''සමාජීය අවශ්‍යතාවන්ට අනුකූල ව ගොඩනැගුණු දෙයක් වන අතර එහි විවිධාකාර බෙදීම් ගණනාවක් පවතී. ඇතැම් විට කරනු ලබන රැකී රක්ෂා මත කුලය යන්න තීරණය වන අතර එයට සාපේක්ෂ ව සමාජයේ ඔවුන් ලබාගෙන සිටින තත්වය අනුව කුලයේ උසස් පහත් බව තීරණය වනු ලබයි. විශේෂයෙන් ම සමාජ තත්වය පදනම් කරගෙන උසස් කුලවල පිරිස් විසින් පහත් කුලවල පිරිස් පීඩාවට පත්කරනු ලබන අතර සමාජීය අවශ්‍යතා මත ගොඩනැගුණු කුලය යන්න අතීතයේ සිට ම නොයෙකුත් ප්‍රභේදකරණවලින් ඉදිරියට ගමන් කරනු දැකගත හැකි ය. මේ ආකාරයට කුලය නිර්වචනය කළ හැකි අතර මෙම කුලය යන්න වඩා පුළුල් වූ මාතෘකාවක් වීම මත විවිධ වූ කෝණයන් ඔස්සේ මෙය විග්‍රහයට බඳුන් කර ඇති බැවින් ඒ පිළිබඳ විමසා බැලීම වැදගත් ය. විශේෂයෙන් ම හින්දු කුල ක්‍රමයේ ආභාසය දකුණු ආසියානු සමාජ ක්‍රමය හැඩගැසීමට ප්‍රධාන වශයෙන් බලපා ඇති බව මානව විද්‍යාඥයන් පෙන්වාදෙන කාරණයකි. එහි දී කුලය යන්න අංශ කිහිපයක් ඔස්සේ තේරුම් ගැනීමට හැකි බව විද්වත් මතය බවට පත් වී ඇත (අමරසේකර, 2001 : 79). විශේෂයෙන් ම සාරධර්ම පද්ධතියක් ලෙස 'කුලය' යන්න විග්‍රහ කර බලන විට දී පරමාදර්ශී ඉන්දියානු කුල ක්‍රමය ඉතා වැදගත් බව ලුවිස්ගේ උපුටනයක් දක්වමින් දයා අමරසේකර සඳහන් කොට තිබේ. මෙපරිද්දෙන් ශ්‍රී ලංකාවේ ද දැඩි ව අනුගමනය කරනු ලබන සාධකයක් ලෙස කුල ක්‍රමය හඳුනාගත හැකි ය. ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කරවීමේ දී බෝධාහාර කුල පැමිණි බවට වංසකතා ඇතුළු ඓතිහාසික මූලාශ්‍රය මඟින් තොරතුරු හමු වේ.

### පර්යේෂණ ගැටලුව

බෝධාහර කුල යනු ශ්‍රී මහාබෝධීන් වහන්සේගේ කාර්යය පටිපාටිය හා සම්බන්ධ ව ගොඩනැගුණු කුල සමූහයක් ද?

### පර්යේෂණ අරමුණු

බෝධාහර කුල හඳුනා ගැනීම හා ඔවුන්ට පැවරී ඇති කාර්යයන් මෙන් ම ඔවුන්ගේ රාජකාරි වෙනුවෙන් වෙන් ව ඇති භුක්තීන් හඳුනා ගැනීම

### පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයට අනුගත වන අතර වංසකතා මූලාශ්‍රයේ එන කරුණු විමර්ශනාත්මක ව අධ්‍යයනය කෙරේ.

### සාහිත්‍ය විමර්ශනය

ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කරවීම, ඒ හා සමඟ ඉන්දියාවේ සිට මෙහි පැමිණි කුලශ්‍රේණි දහ අටකට අයත් පිරිස, අනුරාධපුර යුගයේ සිට මේ දක්වා ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ පැවැත්ම උදෙසා ලැබුණු රාජ්‍ය අනුග්‍රහය, ශ්‍රී මහා බෝධීන් වහන්සේ හා බැඳුණු වත් පිළිවෙත් ආවේණික පුද පූජාවන් හා අද්‍යතනය දක්වා මේ ආශ්‍රිත කාර්යය සංවිධානය සුවිශේෂි ඓතිහාසික මෙන් ම සමාජ සංස්කෘතික කටයුත්තකි. ඒ අනුව මෙම පර්යේෂණය සාර්ථක කර ගැනීම සඳහා මහාවංසය, දීපවංසය, වංසත්ථප්පකාසනිය, බෝධිවංසය, බෝධිවංස ගන්ඨිපදය යන සිංහල ප්‍රාථමික මූලාශ්‍රය හා මෑත කාලීන දෙස් විදෙස් විද්වතුන්ගේ පරියේෂණ පාදක කොට ගත් ද්විතීයික මූලාශ්‍රය ද විමර්ශනයට ලක් කරනු ලැබේ.

සාකච්ඡාව

මහින්දාගමනය හා එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී මහා බෝධියේ දක්ෂිණ ශාඛාව වැඩම කරවීම ශ්‍රී ලංකේය සමාජ සංස්කෘතික පදනමේ කැපී පෙනෙන වෙනස්කම් ගණනාවකට ම උපස්ථම්භක වූ සිද්ධීන්ය. අතිශය පාරිශුද්ධ පූජනීය වස්තුවක් වූ ශ්‍රී මහා බෝධි ශාඛාව මෙරට රෝපණය කළ පසුව ඊට අදාළ පුද සත්කාර නිසි පරිදි පවත්වා ගෙන යෑම සඳහා මනා සංවිධානයක් අත්‍යවශ්‍ය විය. එහෙත් ඒ වන විට මෙරට බුදු දහම ප්‍රචලිත වීම ආරම්භ වී පැවැති බැවින් එම කටයුතු සඳහා නිසි අවබෝධයක් ඇති පිරිසක් ශ්‍රී ලාංකීය සමාජයෙන් යොදවා ගැනීම අසීරු වන බව අවබෝධ කර ගත් නිසා බෝධි ශාඛාව සමඟ එහි ආරක්ෂාව, පුද සත්කාර හා ඊට අදාළ වෙනත් යටිතල පහසුකම් සඳහා පිරිසක් එවීමට ද අශෝක අධිරාජයා කටයුතු කළේ ය. බෝධාහර නම් වූ එම පිරිසට පරිපාලනය පිළිබඳ අවබෝධයක් ඇති රාජකීය සම්භවයක් සහිත උදවිය මෙන් ම විවිධ ශිල්ප ශ්‍රේණිවලට අයත් වූවෝ ද ඇතුළත් වූහ. ඒ අනුව ශ්‍රී මහා බෝධි ශාඛාව මෙරට රෝපණය කළ පසුව එම පිරිස ද අනුරාධපුරය හා තදාශ්‍රිත ව වාසස්ථාන කොට ගෙන එම කාර්යයන් මැනවින් සංවිධානය කොට පවත්වා ගෙන ආ බව වංශකථාවලින් පැහැදිලි වේ.

කුලය යන්න හැඳින්වීමේ දී මේ සම්බන්ධ ව කරුණු රාශියක් අනාවරණය කර ගත හැකි ය. මෙම සමස්ත පර්යේෂණය පුරාවට ම 'කුලය' යන්න ප්‍රධාන තේමාව බවට පත්වන බැවින් එහි ස්වරූපය හා ස්වභාවය පිළිබඳ හඳුනා ගැනීම ඉතා වැදගත් ය. එහි දී දාර්ශනික මතවාදවලට අවධානය යොමු කිරීමට පළමු ව කුලය යන්න පිළිබඳ කරනු ලබන සරල ව මෙසේ නිර්වචනය කළ හැකි ය. කුලය යනු ''සමාජීය අවශ්‍යතාවන්ට අනුකූල ව ගොඩනැගුණු දෙයක් වන අතර එහි විවිධාකාර බෙදීම් ගණනාවක් පවතී. මේ ආකාරයට කුලය යන්න සරල අදහසක් නිර්වචනය කළ හැකි අතර කුලය යන්න වඩා පුළුල් වූ මාතෘකාවකින් වීම මත විවිධ වූ කෝණයන් ඔස්සේ මෙය විග්‍රහයන්ට බඳුන් කර ඇති බැවින් ඒ පිළිබඳ ව මීළඟට විමසා බැලීම වැදගත් ය. විශේෂයෙන් ම හින්දු කුල ක්‍රමයේ ආභාසය දකුණු ආසියානු සමාජ ක්‍රමය හැඩගැසීමට ප්‍රධාන වශයෙන් බලපා ඇති බව මානව විද්‍යාඥයන් පෙන්වාදෙන කාරණයකි. එහි දී කුලය යන්න අංශ කිහිපයක් ඔස්සේ තේරුම් ගැනීමට හැකි බව විද්වත් මතය බවට පත් වී ඇත'' (අමරසේකර, 2001: 79). එහි දී ප්‍රධාන වශයෙන් ම සාරධර්ම පද්ධතියක් ලෙස සමාජ ක්‍රමයක් ලෙස සහ ආර්ථික ක්‍රමයක් ලෙස විග්‍රහ කරනු ලබයි.

සාරධර්ම පද්ධතියක් ලෙස 'කුලය' යන්න විග්‍රහ කර බලන විට දී පරමාදර්ශී ඉන්දියානු කුල ක්‍රමය ඉතා වැදගත් බව 'ලුවිස් ඩුමොන්' දක්වයි (අමරසේකර, 2001: 79). එහි දී ඔහු පෙන්වා දෙනු ලබන්නේ ඉන්දීය කුල ක්‍රමයේ පවිත්‍රත්වය පිළිබඳ අදහස ප්‍රමුඛ සාධකය බවට පත් වී ඇති බව යි. විශේෂයෙන් ම බමුණන්ගේ නීති ග්‍රන්ථ ආදිය දෙස බලන විට දී බමුණන්ගේ පරම්පරා 7ක් උභය කුල පාරිශුද්ධත්වයට පත් වී තිබිය යුතු බව දක්වයි. ඒ අනුව පෙනී යන්නේ සාරධර්ම පද්ධතියක් ලෙස කුලය යන්න විග්‍රහ කළ හැකි බව යි. පෙර සඳහන් කළ පරිදි කුලය යන්න හැඳින්වීමේ දී අනෙක් කාරණය බවට පත්වන්නේ කුල ක්‍රමය යන්න 'සමාජ ක්‍රමයක්' බව යි (අමරසේකර, 2001: 79). විශේෂයෙන් ම මෙම විග්‍රහයට අනුව කරුණු ගෙන හැර දක්වන විට දී කිසියම් සමාජ ක්‍රමයක් අධ්‍යයනය කිරීමේ දී එහි පවතිනු ලබන කුලයන් හඳුනා ගත හැකි ය. ඒ හඳුනා ගැනීම සඳහා පවතිනු ලබන නිර්ණායක කිහිපයක් පවතී. විශේෂයෙන් ම සමාජයක පිරිසක් ආමන්ත්‍රණය කරනු ලබන්නා වූ ක්‍රමය සහ එකී සමාජයේ මිනිසුන්ගේ පවතින පෙළපත් නාමය වැනි කාරණාවල යම් සමාජයක කුලය තීරණය කර ගත හැකි

ය. එහි දී ආමන්ත්‍රණය කරන ක්‍රමවේදය යම් සමාජයක ගරු සරු ආකාරයක් ගනී නම් එමෙන් ම ඔවුගේ පෙළපත් නාමයන් ඉතා ඉහළ නම් එකී සමාජයේ සිටින්නේ කුලයෙන් ඉතා ඉහළ අගතැන්පත් පිරිසක් බව නිගමනය කිරීමේ හැකියාව පවතින අතර ආමන්ත්‍රණය කරන පිළිවෙළ හා පෙළපත් නාමය යම් සමාජයක කිසියම් කොටසක් වෙනුවෙන් පහත් අගයක් ගනී නම් එකී කොටස පහත් කුලයක යැයි නිගමනය කරනු ලබයි. ඒ අනුව කුලය යන්න විග්‍රහ කරන විට එය හඳුනා ගන්නට පවතින තවත් සාධකයක් ලෙස සමාජ ක්‍රමය ද හඳුනාගත හැකි ය.

මෙහි සඳහන් කළ තෙවැනි කාරණය බවට පත්වනු ලබන්නේ කුලය යන්න ''ආර්ථික ක්‍රමයක් ලෙස විග්‍රහ කිරීම යි (අමරසේකර, 2001, 79). ශ්‍රම විභජනයක් සිදුවනු ලබන අතර එහි දී ඔවුන් සමාජයක් තුළ සිදු කරනු ලබන රැකියාව පදනම් කර ගෙන කුලය යන්න තීරණය කිරීමේ හැකියාව පවතී. ඒ අනුව යම් කොටසක් ඉහළ රැකියාවක් කරන්නේ නම් ඔවුන් උසස් කුලයක බවත් පහත් රැකියාවක් කරත් නම් ඔවුන් පහත් කුලයක බවත් තීරණය කරනු ලබයි. නිදසුනක් ලෙස අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලනයට උපදෙස් දෙනු ලැබුයේ බ්‍රාහ්මණ වංසය විසින් වන අතර ඔවුන් සමාජයේ ඉහළ ස්ථානයක සිටියේ රැකියාව පදනම් කර ගෙන ය. එමෙන් ම අනුරාධපුර යුගය ගත් විට පහත් ම තත්ත්වයක් හිමි වූයේ චණ්ඩාලයන්ට ය. ඔවුන්ගේ රැකී රක්ෂාව පිළිබඳ (මහාවංසය, 2012: 10, 9193). විස්තර කරනු ලබන අතර ඔවුහු මළමිනී ගෙන යාම වැනි පහත් රැකියාවල නිරත වූහ. මේ උදාහරණවල ශ්‍රම විභජනය යන්න මනාව පැහැදිලි වන අතර ඒ අනුව ආර්ථික ක්‍රමය හෙවත් රැකී රක්ෂා පදනම් කර ගෙන කුලය යන්න හා එහි උස් පහත් බව තීරණය වී තිබේ. මේ ආකාරයට 'කුලය' යන කාරණය අංශ තුනක් ඔස්සේ විග්‍රහ කරන අතර එහි යම් ප්‍රදේශයක උක්ත කාරණා තුන ඔස්සේ කුලයන් සම්බන්ධ නිගමනයන් කරා එළඹිය හැකි ය. විශේෂයෙන් ම කුලය යන්න මිනිසාගේ උපත සමඟ සම්බන්ධ වන කාරණයක් බැවින් එහි පුද්ගලයකුට කුලය වෙනස් කිරීමට නො හැකි ය. ඒ නිසා ම කුලය යන්න පුද්ගලයාට උපතින් ම ආරෝපිත දෙයක් ලෙස ද විග්‍රහ කළ හැකි අතර හින්දු කුල ක්‍රමයේ ආභාසය ලබමින් මානව විද්‍යාඥයන් කුලය යන්න තේරුම් ගැනීම සඳහා මිනුම් දඬු කිහිපයක් පෙන්වා දී තිබේ. ඒවා නම්,

1. කුලය වනාහි අන්තර්ජන්‍ය දෙයකි.
2. විවිධ කුලයන්ට අයත් සාමාජිකයන් අතර විවිධ සීමා පවතී.
3. කුලය ධුරාවලියක් දක්වන තත්ත්ව සමූහයකි.
4. විවිධ අංශයන්හි විශේෂයෙන් ආහාරය, ලිංගික කටයුතු යනාදියේ දී උසස් කුලයක තැනැත්තකු පහත් කුලයක සාමාජිකයන් ස්පර්ශ කිරීමෙන් 'දූෂණය' වීමක් කුලය තුළ සිදුවෙතැයි පිළිගැනේ.
5. කුලය සාම්ප්‍රදායික වූ රැකියාවන් ආශ්‍රිත වූ දෙයකි.
6. මිනිසකුගේ කුල තත්ත්වය අවසන් වශයෙන් තීරණය කරනු ලබන්නේ ඔහුගේ ජන්මයෙනි.
7. කුල පද්ධතිය සමස්තයක් ලෙස ගත් විට අභිමානය කේන්ද්‍ර කර ගත් පද්ධතියකි (Hutton, 1946: 46) යනුවෙනි.

මේ ආකාර වූ කරුණු විග්‍රහයෙන් කුලය යනු කුමක් දැයි හඳුනා ගැනීමට හැකි ය. උක්ත කාරණාවල විමර්ශනාත්මක ව අධ්‍යයනය කරන විට දී කුලයේ පවතින විවිධ ස්වභාවයන් හා ප්‍රභේදයන් පිළිබඳ හඳුනා ගැනීමේ හැකියාව පවතී. මෙම වර්ගීකරණයට අනුව බලන විට දී අනුරාධපුර

යුගයේ කුල ක්‍රමයට මෙම කාරණාවන් කෙතරම් දුරට සාපේක්ෂ වන්නේ ද යන්න මනාව හඳුනා ගත හැකි අතර උක්ත වර්ගීකරණයේ සමස්තය ගෙන බලන විට පැහැදිලි වන කාරණය වන්නේ පුද්ගලයාට ජන්මයෙන් උරුම වන කුලයේ ඔවුන්ට සදාකාලික බැඳීම් ගණනාවක ජීවත්වීමට සිදු වන බවත් එහි දී ඉහළ කුලවල පිරිස් උදෙසා වරප්‍රසාද හා සමාජ පිළිගැනීම ඉතා ම ඉහළ බවත් ය. මේ ආකාරයට කුලය යන කාරණය විමසන විට විවිධ පැතිකඩ පවතින අතර එහි දී මානව විද්‍යාත්මක දැක්ම කෙසේ ද? යන්න පිළිබඳ තව දුරටත් කරුණු කිහිපයක් දැක්වීම මෙහි ලා ඉතා වැදගත් ය. එහි දී ''ඒ.එල්. ක්‍රෝබර්'' උපුටා දක්වමින් දයානන්ද අමරසේකර මෙසේ සඳහන් කරයි. ''කුලය ජාතිය වූ ඒකකයකි. එවැනි ඒකකයක අන්තර් ජන්‍යමය හා පාරම්පරික උපශාඛාවන් පවතී. එවැනි ඒකකයක් උසස් තත්වයන් සමාජීය ගෞරවයට අනුව භුක්ති විඳී. ඒ අනුව එක් කුලයක් තවත් කුලයකින් ගරුත්වය අනුව වෙන් කෙරේ'' (අමරසේකර, 2001: 79).

උක්ත ආකාරයට දක්වන ලද නිර්වචනයට අනුව කුලය යන්නට නියම සාධාරණීකරණයක් කර ඇති බව මනාව පැහැදිලි කාරණයකි. විශේෂයෙන් ම කුලයේ බිඳී ගිය උපශාඛාවන් පවතින බවත් එහි උස් පහත් බව ගරුත්වයෙන් තීරණය වන බවත් ඔහු දක්වා ඇති අතර කුලය යන්න කුමන ආකාරයේ ස්වරූපයක දෙයක් ද යන්න හා එහි ප්‍රභේද වටහා ගැනීමට එම නිර්වචනය ඉතා වැදගත් බව මෙහි ලා සඳහන් කළ යුතු ය. එමෙන් ම 'ඊ. ආර්. ලීච්' කුල ක්‍රමය මූලික වශයෙන් පරම්පරානුගත ශ්‍රම විභජන රටාවක් යනුවෙන් දක්වනු ලබන අතර එහි ද පෙන්වා දෙනු ලබන කාරණය වන්නේ කුලය යන්න ස්ථාපිත වීම හා එහි පැවැත්ම උදෙසා ශ්‍රමය බෙදීයාමේ හෙවත් එක් එක් පාර්ශ්වයන්ට වෙන් වූ රැකී රක්ෂා ප්‍රධාන වශයෙන් ම බලපා ඇති බව යි. විශේෂයෙන් ම එය පරම්පරාවෙන් පරම්පරාවට උරුම වෙමින් ඉදිරියට පැමිණීම නිසා කුලයන්ගේ රඳා පැවැත්ම තහවුරු වී ඇති බව මෙයින් මනාව විග්‍රහ කර දක්වයි.

මේ ආකාරයට නොයෙකුත් දෘෂ්ටි කෝණවලින් කුලය යන්න පිළිබඳ නිර්වචනය කළ හැකි අතර එහි දී කුලය යන්න හැඳින්වීම නැමැති කාරණයේ දී සමස්තය සාරාංශ කරන විට අවසන් වශයෙන් ප්‍රකාශ කළ හැකිවනුයේ කුලය යනු වර්ෂ දහස් ගණනක ඉතිහාසයක වර්ධනය වෙමින් ඉදිරියට පැමිණි දෙයක් බවත් එහි දී සමාජීය අවශ්‍යතා මත ක්‍රියාත්මක වීමේ දී මෙම කුලය නිර්මාණය වීමට අවශ්‍ය කරුණු සැකසී ඇති බවත් සමාජයේ පවතින්නා වූ නොයෙකුත් සාධක මත මෙම කුලයන්ගේ උස් පහත් බව තීරණය වීම සිදු වන බවත් ය (Leach, 1971: 1 11).

ශ්‍රී ලංකාවේ කුලවාදයේ ආරම්භයට අනිවාර්යයෙන් ම ඉන්දියානු සම්භවයක් ඇති බවත් චෝල (1074-1070) මාඝ (1215 1232 වැනි දකුණු ඉන්දීය ආක්‍රමණ හේතු කොට ගෙන වරින් වර සංක්‍රමණික වූ ජන කණ්ඩායම් නිසා දකුණු ඉන්දියානුකුලවාදය ආභාසය මෙරටට වැඩියෙන් ලැබෙන්නට ඇති බව යි. මෙම සංක්‍රමණිකයන් වෘත්තිමය නිපුණතාවකින් යුත් ජන කොටස් වූ අතර එම වෘත්තිමය හැකියාවන් හේතුකොට ගෙන ඔවුන් මේ රටේ ස්ථාවර පදිංචිකරුවන් වූ බව කිව යුතු ය. කොටස්කරුවන් වශයෙන් ඔවුන් කටයුතු කිරීමත් සමඟ ඉන්දීය කුල ක්‍රමය හඳුනාගත හැකි බ්‍රාහ්මණ ක්ෂත්‍රීය වෛශ්‍ය හා ශුද්‍ර යන සංකල්පය ද මහාකුල, හීනකුල යන සංකල්පය ද ලාංකේය සමාජයේ ස්ථාපිත වන්නට ඇත. මේ පිළිබඳ රැල්ප් පීරිස් සඳහන් කරනුයේ ''බමුණුගම ආදි ශේෂ වී ඇති ස්ථානවලින් පෙනීයන්නේ බ්‍රාහ්මණ, ක්ෂත්‍රීය, වෛශ්‍ය හා ශුද්‍ර යන සිව් වැදෑරුම් කුල ක්‍රමයට සාකල්‍යයෙන් සමාන වූ කුල ක්‍රමයක් සිංහලයන් අතර ද ප්‍රචලිතව තිබුණු බවයි (පීරිස්, 1964 : 183).

මෙසේ ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය යම්තාක් දුරට හෝ ඉන්දියානු කුල ක්‍රමයේ ආභාසයෙන් ගොඩනැගුණ බව පැහැදිලි වේ. ලංකාවේ කුල ක්‍රමය මේ රටේ සමාජ සංවිධානයට ආවේණික වූ ආරක් ඔස්සේ සංවිධානය වී විකාශය වූ බව කිව යුතු ය. ඉන්දීය කුල ක්‍රමයේ බ්‍රාහ්මණයන් මුල් කරගත් දැඩි ආගමික පසුබිමක් මත ගොඩනැගී තිබුණ ද ලංකාවේ ක්‍රියාත්මක වූ කුල ක්‍රමය බෞද්ධ ආගමේ පිළිගැනීම් මත හින්දු කුල ක්‍රමයට වඩා වෙනස් මඟක් ඔස්සේ ව්‍යාප්ත වූ බව තහවුරු වේ. මේ පිළිබඳ විග්‍රහ කරන හෙට්ටිගේ සඳහන් කරයි. හින්දු වාදයේ බලපෑම ශ්‍රී ලංකා සමාජයේ තිබුණ ද ඒ සඳහා දැඩි බලපෑමක් බුදු දහමෙන් ඉදිරිපත් වී තිබේ යැයි පෙන්වා දෙයි. ශ්‍රී ලංකා රජුන් ආගමික දේශපාලනික හා ආර්ථික අංශවල ප්‍රධානත්වය ගැනීම නිසා සිංහල කුල ධුරාවලිය බලයක් සමඟ මිශ්‍ර වූ දෙයක් බව ඔහුගේ අදහස යි (Hettige, 1998: 33). වශයෙන් සඳහන් කරයි.

කුල ක්‍රමය ඉන්දියාවෙන් මෙරටට දායාද කරන ලද දෙයක් බවට ද සමහරුන්ගේ මතයෙකි. ඉන්දියාවේ කුල ක්‍රමය පැන නැඟී ඇත්තේ ආගමික මූලයන්ගෙනි. එය චතුර් වර්ණ ලෙස හඳුන්වයි. එහෙත් ලංකාවේ කුල ක්‍රමයට පදනම් වී ඇත්තේ ශ්‍රම විභජනය හෙවත් රැකියාවෙහි ස්වභාව මත ය. ලංකාවේ කුල, මූලික කොටස් දෙකකට බෙදී ක්‍රියාත්මක විය. එනම්, කෘෂිකර්මාන්තයෙහි නියැළෙන සහ වෙනත් කර්මාන්තවල නියැළෙන ජනයා ලෙසිනි. ලාංකිකයන්ගෙන් බහුතරය කෘෂිකර්මාන්තයෙහි නිරත උසස් කුලවලට අයත් වූ අතර, කෘෂිකර්මාන්තයෙහි නොයෙදුණු ජනතාව හීන හෙවත් තත්වයෙන් පහත් කොට සැලකි හැකි ය. නමුත් මෙම කුල ධුරාවලියෙහි අනුපිළිවෙළ මෙන් ම කුල ගණන පිළිබඳ විවිධ මතවාද පවතී. රොබට් නොක්ස්ගේ උපුටනයක් දක්වමින් නෙල්සන් වීරසිංහ කරුණු දක්වා තිබේ (වීරසිංහ, 2021: 16).

මෙම කුල ක්‍රමය වැඩවසම් සිංහල සමාජයෙහි පැවැත්ම සඳහා ගොනු වූ ප්‍රජා මූල සමූහයකි. එයින් සමාජයෙහි සිදු වූයේ පැවැත්ම වෙනුවෙන් රාජකාරි පංගු පේරුවකි. රජු ජනසමාජයේ හා භූමියෙහි අයිතිකරුවා වූයෙන් රාජකාරි පංගු පේරුව සිදු වූයේ රජු කේන්ද්‍ර කරගෙන ය. රජුගේ භාණ්ඩාගාරය වෙනුවෙන් භවබෝග නිෂ්පාදනයත්, සේවා සැපයුමත් ඒ වෙනුවෙන් ආම්පන්න සෑදීමත්, කුල අනුව පංගු පේරුවට සිදු විය. භවබෝග නිෂ්පාදනයට හැර අනෙකුත් දේ සඳහා විශාල ශ්‍රමයක් අවශ්‍ය නොවූයෙන් එවැනි රාජකාරි සඳහා වූ ප්‍රජාවට දෙනු ලැබූයේ කුඩා බිම් පෙදෙස් සමඟ යැපීම වෙනුවෙන් සීමිත අවකාශයකි. කුල ධුරාවලිය තහවුරු වන්නේ එවැනි වූ ප්‍රමුඛතා සහිත පංගු පේරුවත් සමඟ ය. මෙම කුල ධුරාවලියේ පිහිටීම තේරුම් ගත හැකි එක් සාධකයක් වනුයේ පැරණි නුවර කලාවිය වැව් පද්ධතියේ සැලසුම පිරික්සීමෙනි. පැරණි වැව් පද්ධතිය සකස් වී තිබුණේ කුඩා වැව්වලින් ආරම්භ වී මහා වැව් දක්වා වූ දම්වැලක් මෙනි.

20 වන සියවසේ දී සිංහල කුල ධුරාවලිය ආකෘතිය තව දුරටත් වෙනස් වූ බව රයන්ගේ විග්‍රහයෙන් පෙනීය යි. සිංහල කුල ක්‍රමය පිළිබඳ පුළුල් ව අධ්‍යයනය කළ ඔහු කුල ධුරාවලිය පහත සඳහන් ආකාරයෙන් ඉදිරිපත් කරන ලදි. එනම් ගොවිගම, කරාව, සලාගම, දුරාව, නවම්දන්නා, හන්නළි, හුණු, රදා, වහුම්පුර, හින්න, බඩහැල, පනික්කි, වෙල්ලිදුරයි, පන්නදුරයි, බෙරව, පදු, ඔලී, පලි, කින්නර, රොඩී, කවිකාර, දෙමළගත්තර, (Ryan, 1993; 93 94). යනාදී වශයෙනි. ශ්‍රී ලංකාවේ මහින්දාගමනය හා දුමින්දාගමනය කරණ කොට ගෙන ලක්වැසියන්ට අත් වූ ප්‍රතිලාභ අසීමිත ය. පූජනීය හෙවත් ආගමික වශයෙන් ලැබුණු එම දායාද කිසිවෙකු විසිනුත් තක්සේරු කළ නො හැකි අමූල්‍ය ප්‍රතිලාභයෝ වෙති. මේ දායාදයන් සමඟ ම මෙහි සපැමිණි

බෝධාහර කුල නොහොත් කාර්මික ශ්‍රේණි හේතුකොට ගෙන ලාංකේය සිංහල බෞද්ධ සංස්කෘතික ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයෙහි ලා ලැබුණු අනුබලය හා ආලෝකයත් නිරීක්ෂණයට පාත්‍ර විය යුතු ය. එම කාර්මික කුලය / ශ්‍රේණි වනාහි භාරත දේශයෙන් මෙහි ආනයනය කරන ලද අපූර්ව විනිමය මූලධර්ම සම්පතක් වැනි ය. මෙහි ඵලයක් ලෙස ලාංකේය මිනිස් චින්තනය, සමාජ රටාව, චාරිත්‍ර වාරිත්‍ර, වින්දනය පිළිබඳ නව්‍ය විචාරාධාර, කර්මාන්ත, වෘත්තීය ශිල්පීය ප්‍රවණතා යන හැම ක්ෂේත්‍රයක ම පෙර නො වූ විරූ මහා පරිමාණ ප්‍රගමනයක් වූ බවට සාධක ඉදිරිපත් කළ හැකි ය. ලාංකිකයන්ගේ ජාතික අනන්‍යතාව එම ආගමික සිද්ධිය පසුබිම් කොට ගෙන වෙනත් මුහුණුවරකින් එම සිද්ධියේ ඒක දේශයක් වන බෝධාහාර ශ්‍රේණි පිළිබඳ නිරීක්ෂණය කරන්නේ එම කුල නිසා රාජ්‍ය තන්ත්‍රයත් පොදුවේ සමාජ සංස්ථාවත් බද්ධ වී ක්‍රියාත්මක වූ අයුරු ද විමසා බලමිනි.

ගුණාත්මක නොව සංඛ්‍යාත්මක පක්ෂයෙන් විමසන විට බෝධාහාර ශ්‍රේණි පිළිබඳ ව මූලාශ්‍රයන්හි විවිධ විසදෘශතා ඇති බව හඳුනාගත හැකි ය. 'කුලය' යන්න ඇසූ සැණින් නිතැතින් ම ජනිත වනුයේ අනාදිමත් කලෙක සිට සමාජ ව්‍යූහයේ ක්‍රියාත්මක වෙමින් එම ඉතිහාසය දිගේ නො නැවතී ගලාගෙන එන එක්තරා පන්ති විෂයක ආකල්පයක් හෙවත් උසස්, පහත් ලෙස මිනිසා වර්ග කොට බෙදා පෙන්වීමකි. නූතන සමාජ චින්තනය අනුව තරමක් හෝ අවශ්‍ය ශුභදායක ආකල්පයක් නො වන බව වියතුන් විසින් පෙන්වා දී තිබේ. එහෙත් සමාජ සංස්ථාව කොටස්වලට බෙදා දමන මෙම ආකල්පය මේ මොහොත දක්වා ම ලෝක සමාජය විසින් අත්හරින ලද බවක් පෙනෙන්නට නැත. කුලය පිළිබඳ මේ භේදකාරී හැඟීම් සහමුලින් ම අතුගා දැමූ සමාජයක් ලොව කොතැනක හෝ දක්නට නැත. සිංහලයන් අතර කුලභේදය ඇති කිරීමට බෝධි පූජා රාජකාරි ක්‍රමය අනුබලයක් වූයේ යැයි නඟා ඇති තර්කය තව දුරටත් විමසා බැලිය යුත්තකි. මහින්දාගමනයෙන් පසු ශ්‍රී ලංකාවේ පැවැති කුල ක්‍රමයේ දැඩි බව ලිහිල් වූ බව තවත් විචාරකයෝ ප්‍රකාශ කරති.

කුල ආකල්පය ඒ විකාශය හා ඒ හා සබැඳි චින්තන රටා සාවද්‍ය හෝ නිරවද්‍ය, අර්ථකාරී හෝ අනර්ථකාරී ද යනාදී ආකෘතිමය විශ්ලේෂණයන් මෙහි දී අපට අදාළ නො වේ. දීර්ඝ වශයෙන් වෙන ම අධීක්ෂණයකට සුදුසු මාතෘකාවකි. අනිත් අතට පෙර අපර දෙදිග ම විචාරකයන් මේ පිළිබඳ ව තර්ක විතර්ක සංවාද සාකච්ඡා පවත්වා ඇත. මෙහි අධෝලිපි කර ඇති ග්‍රන්ථවල මේ විෂය පිළිබඳ ගැඹුරු අධ්‍යයන දක්වා ලැබේ. කුලභේදය පිළිබඳ ව සංකල්පය ප්‍රාග් ඓතිහාසික යුග දක්වා ඈතට විහි දී ගිය එකක් බව නම් පිළිගැනීමට සුදුසු වෙයි. බුදුසමය පැමිණීමටත් සියවස් කිහිපයකට පෙර පටන් ම ආර්යයන් වරින්වර මෙහි සංක්‍රමණය වී ඇති බවත්, ඔවුන් සමඟ භාරතය පුරා ප්‍රචලිත ව පැවති කුල, වංශවලට අයත් වුවත් මෙහි පැමිණි බවත් පුරාවිද්‍යාඥයන් පෙන්වා දී ඇත. ආර්ය සංක්‍රමණය අවම වශයෙන් ක්‍රි.පූ. පස්වැනි සියවස පමණ ආරම්භ වී ඇති බව පිළිගැනීමට බාධාවක් නැත. කුදු මහත් ශ්‍රේණි වෙළෙඳාම වැනි දේ සඳහා නව උපනිමේෂයක් සොයා යෑම වැනි අපේක්ෂා මතය මෙහි පැමිණි නමුත් ඔවුන්ගේ ජන්ම භූමිය එතෙක් ක්‍රියාත්මක වෙමින් තිබුණු කුලභේද පිළිබඳ ආකල්ප ද රැගෙන ම ඔවුන් මෙහි පැමිණි බවට අනුමානයක් නැත.

බෝධාහර කුලයේ කාර්යභාරය පිළිබඳ ව විමර්ශනය කරන විට දී ප්‍රධාන අංශ දෙකක් යටතේ එය සාකච්ඡා කළ හැකි ය. ඉන් ප්‍රථම කාරණය නම් රාජ්‍ය පාලනය හා සබැඳි කාර්යභාරය යි. විශේෂයෙන් ම මෙහි දී වැදගත් යමක් ප්‍රකාශ කළ යුතු ය.

එනම් ඔවුන්ගේ ප්‍රධාන වගකීම බෝධිය සුරක්ෂිත කිරීම බව බැලූ බැල්මට අපට පැහැදිලි වන්නා වූ කාරණයකි. එහෙත් ඔවුන් ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු ඔවුන්ට පැවරුණු වගකීම් හා ප්‍රදානයන් ලෙස බලන විට දී බෝධියේ සුරක්ෂිත බව තහවුරු කිරීමට අමතර ව ශ්‍රී ලාංකේය සමාජ ප්‍රගමනය උදෙසා ද ඔවුන් දායක වී ඇති බව මනා ව හඳුනා ගත හැකි ය.

බුදු දහමින් පෝෂිත ලංකා සමාජයේ කුල හා සමාජ ප්‍රභේදයන්ගේ නව ප්‍රවණතාවක් වශයෙන් බෝධාහර කුලයෙහි බිහිවීම හඳුනා ගත හැකි ය. ඒ අනුව ප්‍රථමයෙන් ම මෙම බෝධාහර කුල යනු කවුරුන් ද? යන කාරණය හඳුනා ගැනීම ඉතා වැදගත් ය. ඒ පිළිබඳ ඉතාමත් ම කෙටියෙන් සඳහන් කළ හොත් ශ්‍රී මහා බෝධිය ශ්‍රී ලංකාවට වැඩම කරන විට දී එහි වැඩ කටයුතු කරමින් එහි සුරක්ෂිත බව තහවුරු කිරීමට පැමිණි එක් එක් වංශයන් නියෝජනය කරනු ලැබූ පිරිස් බෝධාහර කුල ලෙස හඳුන්වා දීම ඉතා නිවැරදි ය. මෙම බෝධාහර කුල සම්බන්ධ ව මූලාශ්‍රය ගණනාවක ම තොරතුරු ඇතුළත් වේ. ඒ අතර මහාවංසය, අශෝක රජතුමා විසින් එවන ලද ශිල්ප ශ්‍රේණි පිළිබඳ තොරතුරු රැසක් අන්තර්ගත කර තිබේ. එහි සඳහන් පරිදි පැමිණ තිබෙන්නේ කුල අසූ දෙකක් පමණි. එයින් දේව කුල දහ අටක් ද අමාත්‍ය කුල අටක් ද බ්‍රාහ්මණ කුල අටක් ද සෙට්ඨි කුල අටක් ද ගොපල්ලන් සමඟ විශ්වාස කුල අටක් ද කුලිංග, පේසකාර, කුම්භකාර කුල ද තරච්ඡ කුල ද අට අට බැගින් දුන්නේය. ''මහාබොධිරක්ඛණත්ථං අට්ඨාරස රථෙසහො දෙවකුලානි දත්වාන අට්ඨාමච්චකුලානි ච,, ''අට්ඨ බ්‍රාහ්මණකුලානි අට්ඨ සෙට්ඨිකුලානි ච ගොපකානං පධානානං විස්සාසානං(?) කුලානි ච,, ''කුලිංගපෙසකාරානං කුම්භකාරකුලානි ච තරච්ඡානං කුලානෙ'ව අට්ඨඅට්ඨ අදාසි සො,, (මහාවංසය, 2012: 19, 103).

මේ පිළිබඳ පාලි බෝධිවංසය, සාරාර්ථදීපනී, සමන්තපාසාදිකාව, සද්ධර්මරත්නාවලිය, පූජාවලිය, ආදි මූලාශ්‍රය ගණනාවකට තොරතුරු සඳහන් වන අතර දීපවංසයයෙහි ඉතා ම කෙටි සටහනක් මෙම බෝධාහර කුල සම්බන්ධ ව කරුණු දක්වා තිබීම ද විශේෂත්වයකි. මෙම මූලාශ්‍රය අතුරින් බෝධිවංස විස්තරයට අනුව බෝධිය රකිනු පිණිස මෙහි පැමිණි කුලයන් මෙසේ විස්තර කරනු ලබයි. සිංහල බෝධිවංසයට අනුව ''රජකුල අටක් ද, සිටු කුල අටක් ද, බමුණු කුල අටක් ද, කෙළෙඹි කුල අටක් ද, වෙළෙඳ කුල අටක් ද, දුණුවා කුල අටක් ද, සරස් කුල අටක් ද, කිළිඟු කුල අටක් ද, කපු කුල අටක් ද , බලත් කුල අටක් ද, පෙහෙර කුල අටක් ද, කුඹල් කුල අටක් ද, මල්කරු කුල අටක් ද, ඔසු දවටු කුල අටක් ද, සන්නාසි කුල අටක් ද, අරක්කැමි කුල අටක් ද, කඹුරු කුල අටක් ද, ලෝකුරු කුල අටක් ද, ස්වර්ණකාර කුල අටක් ද, උයන් ගොවු කුල අටක් ද, බෙරවා කුල අටක් ද, සත්කරු කුල අටක් ද, එවූ බව විස්තර කරනු ලබයි'' (සිංහල බෝධිවංසය, 1960: 254-255; පාලි බෝධිවංසය, 1996: 96).

බෝධිවංසයෙහි සඳහන් ඉහත කුල අතරට ඇතුළත් නො වන වෙස්ස හා ගෝප කුල මහාවංසයෙහි සඳහන් වීම ද විශේෂත්වයකි. එහි තවත් කුල විස්සක් අතහැරී තිබේ. සමන්තපාසාදිකාව සඳහන් කරන්නේ කුල හැටහයකි. ඒ මෙසේ ය. අට්ඨරස දෙවතාකුලානි ච නාග යක්ෂ කුල ඇතුළත් ව දේවතා කුල දහ අටක් ද, අට්ඨඅමච්චකුලානි ච ඇමති කුල අටක්ද, අට්ඨබ්‍රහ්මකුලානි ච බමුණු කුල අටක් ද, අට්ඨකුටුම්බිකකුලානි ච කෙළඹි කුල අටක්ද, අට්ඨගොපකකුලානි ච මුරකාර කුල අටක් ද, අට්ඨතරච්ඡකුලානි ච කිරි දෙනුන් පාලනය පිණිස තරස් තරහල් කුල අටක් ද, අට්ඨකාලිංගකුලානි ච කලිඟු කුල අටක් ද වශයෙනි (සමන්තපාසාදිකාව, 2005: 298).

සද්ධර්මරත්නාකරයේ සඳහන් වන්නේ කුල එකසිය හැත්තෑවකි. පාලි වසංකතාවන්හි සඳහන් කුල අතුරින් බ්‍රාහ්මණ, කුටුම්බික, වාණිජ, ධනුග්ගහ, සිබ්බකාරි යන කුල පහ එයින් ඉවත් වී ඇත. දේවතා කුලානි දහ අටක් ද, ඛත්තිය කුලානි අටක් ද, කරච්ඡ කුලානි අටක් ද, සෙට්ඨි කුලානි අටක් ද, කාලිංග කුලානි අටක් ද, කප්පක කුලානි අටක් ද, බලත්ත කුලානි අටක් ද, පේසකාර කුලානි අටක් ද, කුම්භකාර කුලානි අටක් ද, මාලාකාර කුලානි අටක් ද, ගන්ධකාර කුලානි අටක් ද, සූධක කුලානි අටක් ද, කම්මාර කුලානි අටක් ද, ලෝහක කුලානි අටක් ද, උද්‍යාන පාලක අටක් ද, වඩ්ඪකි කුලානි අටක් ද, චිත්තකාර කුලානි අටක් ද, ආතොජ්ජවාදක කුලානි අටක් ද, ඡත්තකාර කුලානි අටක් ද, සුවර්ණකාර කුලානි අටක් වශයෙනි (සද්ධර්මරත්නාකරය, 1955 : 349). පූජාවලිය කතුවරයා මේ හැම වාර්තාවකට වෙනත් අදහස් ප්‍රකාශ කරයි. ''මහබෝ වඩ ආ ක්ෂත්‍රිය කුමරුවන් අටදෙනා අතුරෙන් බෝ ගොත් කුමාරයන්ට ලක් මහ ලේනා තනතුරු දී සුමිත් කුමාරයන්ට ජය මහ ලේනා තනතුරු දී සඳගොත් කුමාරයන්ට විල්බාමුල රජුන්ගේ තනතුර දී,, (පූජාවලිය, 1953: 770).

මහාවංසය ආදි මූලාශ්‍රය ගත් විට ප්‍රධාන කුල හැරෙන්නට මෙවැනි පරිපූර්ණ විස්තරයක් එහි දැක ගත නො හැකි ය. කෙසේ වෙතත් මේ ආකාරයට සෑම කුලයකින් ම 8 බැගින් බෝධිය රකිනු පිණිස එවූ මෙම බෝධාහර කුලයන් අතුරින් රජ කුල අටට ප්‍රධානත්වය හිමි විය. මෙම රජ කුල අටෙහි බෝධිගුප්ත කුමාරයා හා සුමිත්ත කුමරු ප්‍රධානත්වය ගනු ලබන ආකාරය දැක ගත හැකි ය. ඒ අනුව මූලාශ්‍රය පෙන්වාදෙන ආකාරයට බෝධිගුප්ත කුමරු හට ලක්දිව ජයමහ ලේ නා තනතුර ලබා දී සියලු කුල ඔහු යටතට පත් කරන ලදි. මේ ආකාරයට ප්‍රධාන කුමාරවරුන් දෙදෙනෙකු යටතට වගකීම් පවරමින් එම බෝධාහර කුලවල අභ්‍යන්තර කටයුතු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදි.

බෝධාහර කුලයේ කාර්යභාරය පිළිබඳ විමර්ශනය කරන විට දී ප්‍රධාන මාතෘකා දෙකක් යටතේ එය සාකච්ඡා කළ හැකි ය. ඉන් පළමු වැන්න නම් රාජ්‍ය පාලනය හා සබැඳි කාර්යභාරය යි. ඔවුන්ගේ ප්‍රධාන වගකීම බෝධිය සුරක්ෂිත කිරීම බව බැලූ බැල්මට අපට පැහැදිලි වන නමුත් ඔවුන් ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු ඔවුන්ට පැවරුණු වගකීම් හා ප්‍රදානයන් දෙස බලන විට දී බෝධියේ සුරක්ෂිත බව තහවුරු කිරීමට අමතර ව ශ්‍රී ලාංකේය සමාජ ප්‍රගමනය උදෙසා ද දායක වී ඇති බවත් මනාව හඳුනාගත හැකි ය. ඒ අනුව රාජ්‍ය පාලනයේ විධිමත් බව උදෙසා බෝධාහාරයන් කටයුතු කළේ කෙසේ ද යන කාරණය මෙතැන් සිට විමසා බැලිය හැකි ය.

ඒ අනුව ප්‍රථම කොට ම රජ කුමරුවන්ගෙන් යුතු කුලයේ බෝධිගුප්ත කුමරු හා සුමිත්ත කුමරු පිළිබඳ කරුණු විමර්ශනය කරන විට දී පිළිවෙළින් බෝධිගුප්ත කුමරුට බෝධි පරිපාලනය හා සුමිත්ත කුමරුට කුලවාසින් පවරා දුන් බව සඳහන් කරයි ''සුමිත්තබොධිගුත්තාභිධානං සක්කපුත්තයුගං අත්තනා සමට්ඨානෙ ඨපෙත්වා කණිට්ඨස්ස රාජකුමාරස්ස සුමිත්තාභිධානස්ස කුලවාසිනො දත්වා, ජෙට්ඨෙන බොධිගුත්ත කුමාරෙන මහාබොධිං සම්පටච්ඡාපෙත්වා'' (මහාබෝධිවංසො, 1890: 96). මූලාශ්‍රයගත තොරතුරු අනුව පෙන්වාදෙන කාරණය නම්, මොවුන් දෙදෙනාට පරිපාලන කටයුතු පිරිනැමීම අශෝක අධිරාජයා විසින් ම ඉටු කරනු ලැබූ කාරණයක් බව පැහැදිලි වේ (ධම්මරක්ඛිත හිමි, 2000: 135). එහි දී පරිපාලන පළපුරුද්ද ඇත්තකුට මිස වූ සාමාන්‍ය කෙනෙකුට මෙවැනි වගකීම් භාරදීමක් කෘතහස්ත පාලකයකු වූ අශෝක රජු කිසි දිනකත් සිදු නො කළ බව ප්‍රත්‍යක්ෂ කරුණකි. එසේ ම ආදර්ශවත් හා සාර්ථක ලෙස කරන ලද පරිපාලනය නිසා බෝධිගුප්ත කුසලතා ප්‍රදර්ශනය කරනු ලැබූ

පාලකයකු බවට නොබෝ කලකින් පත් වූ බව දක්වන අතර එවැනි තත්වයක් බෝධි සංරක්ෂණය වැනි සීමිත කටයුත්තකට ඔහු ගොනු කර තැබීම පාඩුවක් වන බැවින් පරිපාලන අංශයේ වෙනත් කටයුතු ඔහු වෙත නිරායාසයෙන් ම පැවරෙන්නට ඇති බව සිතිය හැකි ය. ඒ අනුව මූලාශ්‍රය පෙන්වාදෙන කාරණය නම්, මොවුන් දෙදෙනාට පරිපාලන කටයුතු පිරිනැමීම අශෝක අධිරාජයා විසින් ම ඉටු කරනු ලැබූ කාරණයක් බව යි. ඒ අනුව මූලාශ්‍රය පෙන්වා දෙනුයේ බෝධි ගුප්ත කුමරුට පැවරූ 'ලංකා ජයමහා ලෙනා' තනතුර ශ්‍රී ලාංකේය රාජ්‍ය තන්ත්‍රයේ මෙන් ම පරිපාලන අංශයේත් වැදගත් තැනක් හිමි කර ගත් බව පෙනෙයි.

රාජ්‍ය පාලන කාර්යය උදෙසා බෝධාහර කුලයන් ක්‍රියාකාරී වී ඇති ආකාරය පිළිබඳ තව දුරටත් කරුණු විමර්ශනය කරන විට දී බෝධි ගුප්ත හා සුමිත්ත කුමරු හැරුණු විට ඔවුන් සමඟ පැමිණි අනෙක් රාජ කුමාරවරුන් කිහිප දෙනෙකු ද රාජ්‍ය පරිපාලන විෂයට ඍජු දායකත්වයක් ලබා දී ඇති බවට බෝධිවංස තොරතුරුවලින් අනාවරණය වෙයි. 'ලංකා මහාබොධි මහා ලානට්ඨානං' යන්නෙහි 'මහාබොධි' යන්න ලොප් වී ගොස් 'මහා ලානට්ඨාන' යි ඉතිරි විය හැකි යයි ද,'ජගති මහාලාන' යන්නට 'ලංකා' යන්නක් එකතු විය හැකි යයි ද අනුමාන කරන මැදඋයන්ගොඩ විමලකීර්ති හිමියෝ ඒ වනාහි මෙහි දී නොව භාරතයේ දී ම සිදු වූවකි යි ද ප්‍රකාශ කරති. තනතුරක නාමය කලින් කලට වෙනස් වීම අරුමයක් නො වේ. අභිලේඛන හා සාහිත්‍ය මූලාශ්‍රයන්හි ලක්මහ ලැන, ලක්මහලේනා, ලක්මහලන, ලක්මහලේ, මහලේ, මහා ලෙඛක, ලෙදරු, ලෙයා ආදි නම්වලින් හැඳින් වූ තනතුර පසු කාලයේ දී බෝධි පරිපාලනයෙන් සහමුලින් ම වෙන් වී රාජ්‍ය පරිපාලන ක්ෂේත්‍රයට අවතීර්ණ වූ බවට සාධක හමු වේ.

**සමාලෝචනය**

මහින්දාගමනයේ ප්‍රතිඵලයක් ලෙස ලක්දිවට දයාද වූ ශ්‍රී මහ බොධින් වහන්සේ වූ කලී ඒ වනවිට ශ්‍රී ලංකාවත් ඉන්දිවත් අතර පැවති රාජ්‍යයතාන්ත්‍රික සබඳතාවන්ගේ උත්කෘෂ්ටභාවය ද මැනවින් පිළිබිඹු කරන සුවිශේෂී පූජනීය වස්තුවකි අශෝක අධිරාජ්‍යයාගේ ධර්ම විජය සංකල්පයෙහි අග්‍ර ඵලයක් ලෙස හඳුනාගත හැකි දුමින්දාගමනය හුදෙක් බෝධින් වහන්සේ නමක් ලක්දිවට ලැබීම පමණක් නොව ඒ හා සැබැඳි සංස්කෘතියක් ද උරුම කරදීමට උපස්ථම්භක වූවකි. බෝධින් වහන්සේ සමඟ එහි රැකවරණය, අදාළ වත්සිරිත් හා යටිතල පහසුකම් සඳහා ඒ පිළිබඳ මනා පරිචයකින් හෙබි ජනසමූහයක් ද මෙරටට එවීම පාදක කොට ගෙන යථොක්ත බෝධි සංස්කෘතිය ස්ථාපනය වී තිබේ. බෝධාහර පරපුර නමින් හැඳින් වූ එලෙස පැමිණි පිරිස රාජකුමාරවරුන් මෙන් ම විවිධ කුල ශ්‍රේණිවලින් ද සමන්විත විය. එම පිරිස් අනුරාධපුරය තදාශ්‍රිත ව වාසස්ථාන කොට ගෙන බෝධිය හා බැඳුණු සේවා රාජකාරි කරගෙන ගිය අයුරු ඓතිහාසික මූලාශ්‍රයන්ගෙන් මනාව පැහැදිලි වේ. ශ්‍රී මහ බෝධින් වහන්සේ සමඟ මෙරටට පැමිණි පිරිස බෝධාහර පරපුර ලෙස පොදුවේ හැඳින් වූව ද නිශ්චිත ව බෝධාහර ලෙස හඳුනාගත හැකිවනුයේ බෝධි ගුත්ත සෙසු රාජකුමාරවරුන් පිරිස යි. බෝධිය පිළිබඳ ප්‍රමුඛ පරිපාලන කටයුතු සංවිධානය වී ඇත්තේ ඔවුන්ගෙනි. ඒ හැරුණු විට ශ්‍රී මහ බෝධියට සම්බන්ධ පුද පූජා, විවිධ සේවා රාජකාරි හා නිෂ්පාදන කාර්යයන් සඳහා කුල ශ්‍රේණි කණ්ඩායමක් ද මෙරටට පැමිණ තිබේ. මෙම කුල ශ්‍රේණීන් පශ්චාත්කාලීන විවිධ සමාජ සංස්කෘතික හේතු මත වෙනස් කම්වලට භාජන වී ඇති බව දක්නට ලැබේ.

## මූලාශ්‍රය

එදා හෙළදිව (An Historical Relation of the Island of Ceylon) රොබට් නොක්ස්, (1997). (පරි.) ඩේවිඩ් කරුණාරත්න, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

දීපවංසය, (1950) (සංස්.), ඤාණානන්ද හිමි, පී. පානදුරඃ සටාර් යන්ත්‍රාලය.

ධම්මරක්ඛිත හිමි, ඩබ්ලිව්. (2000). ශ්‍රී මහා බෝධීන් වහන්සේ, ඉතිහාසය හා තදනුබද්ධ සංස්කෘතිය, දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

පාලි මහා බෝධිවංසය, (1996). (සංස්.), පියරතන හිමි, බඩ්ලිව්. කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පීරිස්, ආර්. සිංහල සමාජ සංවිධානය, මහනුවර යුගය, (1964). බොරලැස්ගමුවඃ

පූජාවලිය, (1951). (සංස්.), අමරමොලි හිමි, ඩබ්ලිව්. කොළඹඃ රත්නාකර පොත් වෙළඳහල.

මහා බෝධිවංස ග්‍රන්ථිපදය, (1985). ධම්මපාල හිමි, ජී. කඹුරුපිටියඃ විද්‍යානිකේත විද්‍යායතන පිරිවෙන.

මහාවංසය, පළමු හා දෙවන වෙළුම්, (2012). (සංස්.), වික්‍රමගමගේ, සී. දෙහිවලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

රණසිංහ සී. සිංහල සමාජයේ කුල ක්‍රමය, (2015). වැල්ලම්පිටියඃ චතුර මුද්‍රණාලය.

සමන්තපසාදිකා නම් වූ විනයට්ඨකථා බාහිර නිදාන වණ්ණනා, (2005). (සංස්.), විපස්සි හිමි, ආර්. කොළඹඃ සමයවර්ධන පොත්හල (පෞද්) සමාගම.

සිල්වා, කේ. කුලය පන්තිය සහ ලංකාවේ සමාජ ගැටුම්, (2005). බොරලැස්ගමුවඃ සීදේවී ඕෆ්සෙට් මුද්‍රණාලය.

Brose, B. (2021). Xuanzang: Chins's Legendary Pilgrim and Translator, Colorado: Shambhala Publication, ink, http://google,lk

Davy, J, An Account of the Interior of Ceylon and Its Inhibitants with Travels in that Island, (1821). London.

Hutton, J. H. (1946). Caste in India, its nature, Function and Origiions, London: Cambridge University Press.

Leach, E. R. (1971). Aspects of Caste in South India, Ceylone and North West Parkisthan, London: Canbridge university Press.